සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 7 | විෂයය / பாடம் / Subject : සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper : I,II | කාලය / காலம் / Time : පැය 02 |

නම :- ......................................................................................... විභාග අංකය :- ..........................

**සැලකිය යුතුයි:**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

- **පහත සඳහන් සාම්ප්‍රදායික යෙදුම්වලට ගැළපෙන පිළිතුරු තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

(01) තම පුතාගේ දඩබ්බර හැසිරීම ගැන විදුහල්පතිතුමාගෙන් දැනගත් පියාගේ <u>මුහුණ ඇඹුල් වී</u> ගියේ ය.

(1) පශ්චාත්තාප වීම (2) දුකට පත් වීම
(3) මුහුණේ පැහැය වෙනස් වීම (4) ලැජ්ජාවට පත් වීම

(02) ''ආඬි හත් දෙනාගේ කැඳ හැලිය වාගෙයි''

(1) හැමදෙනා ම සමගිව වැඩ කළ යුතු බව
(2) අනුන් රවටන්නට යැමෙන් තමන් ද රැවටෙන බව
(3) අනුන්ගේ උදව්වෙන් ජීවත් වන බව
(4) නිෂ්ඵල ක්‍රියාවක් බව

- **පහත දැක්වෙන ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාරයෙහි යෙදෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(03) සැහැල්ලුව

(1) ලේසි වීම (2) හොඳ වීම (3) ගමන් මල්ල (4) කරදර අඩු වීම

(04) කොළ මැඩීම

(1) ගොයම් පෑගීම (2) කොළ සිටුවීම (3) කොළ ඇහිලීම (4) කොළ අතුගෑම

- **05, 06 ප්‍රශ්නවල දී ඇති වචන අතරින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(05) (1) ප්‍රතිසංස්කරණය (2) ප්‍රතිසන්ස්කරණය
(3) ප්‍රතිසංස්කරනය (4) ප්‍රතිසන්ස්කරනය

(06) (1) සැළලිහිණි සංදේශය (2) සැලළිහිණි සංදේශය
(3) සැළලිහිනි සංදේශය (4) සැලළිහිනි සංදේශය

Department of Education – Western Province

- **පහත සඳහන් වචන අතරින් මහාප්‍රාණ අක්ෂරය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(07) (1) ශ්‍රේණිය (2) සංකීර්ණ (3) සජ්ඣායනා (4) මුද්‍රණ

- **පහත සඳහන් වචන අතරින් සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(08) (1) ලේඛනය (2) ග්‍රන්ථ (3) ගුඬ (4) ගිජිඳු

- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.**

(09) ළමයි වතුර බී සෙල්ලම් කළහ.
(1) පූර්ව ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා (3) විධි ක්‍රියා (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා

- **පහත දැක්වෙන වාක්‍යාංශයට ගැළපෙන තනිපදය තෝරා යටින් ඉරක් අඳින්න.**

(10) පළමු වතාවට සිරිපා කරුණා කරන්නා
(1) නඩේගුරා (2) කෝඩුකාරයා (3) හින්නා (4) ළපටියා

- **පහත දැක්වෙන වාක්‍යවල යොදා ඇති විරාම ලකුණු හඳුනාගෙන එහි විරාම නාමය යටින් ඉරක් අඳින්න.**

(11) සිංහබාහු : කිම් ද මැණියනි ඔබ මේ පවසන වදනා
(1) කොමාව (2) තිත් කොමාව (3) දෙතිත (4) උඩු කොමාව

(12) ආර්ථික - සමාජ තත්ත්වය
(1) කෙටි ඉර (2) තිත (3) කොමාව (4) දෙතිත

- **නිවැරදි වචනය වරහනින් තෝරන්න.**

(13) උක්ත පදයකි.......................... ( ඔහු / ළමයකු )

(14) ප්‍රථම පුරුෂ බහු වචන පදයකි. ....................... ( අපි / ඔවුහු )

(15) සර්ව නාම පදයකි. ...................... ( අප / ගුරුවරයා )

- **හිස්තැන්වලට සුදුසු පද වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) (මිනිසුන් / මිනිස්සු) ..................................... කුඹුරු කොටති.

(17) අම්මා වී පැදුර ගෙට .................................... (ගනියි / ගනිති)

(18) සිසුහු පාසලට ............................. (ගියහ / ගියේ ය)

- **පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ විධිය තෝරා යටින් ඉරක් අඳින්න.**

(19) ගංගාව සෙමින් ගලා යයි.
(1) මිශ්‍ර ක්‍රියා (2) නාම විශේෂණ
(3) ක්‍රියා විශේෂණ (4) පූර්ව ක්‍රියා

Department of Education - Western Province

(20) <u>යහපත්</u> ළමයි මල් සේ ලොව සතුටු කරති.

(1) මිශ්‍ර ක්‍රියා (2) නාම විශේෂණ

(3) ක්‍රියා විශේෂණ (4) පූර්ව ක්‍රියා

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **01 හා 02 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ සකස් කළ ස්වනිර්මාණ සංග්‍රහය ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(අ) ස්වනිර්මාණ සංග්‍රහයට ඔබ යෙදූ නම ලියන්න. (ලකුණු 02)

(ආ) එහිදී ඔබට මග පෙන්වූ දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ඉ) එය සැකසීමේ දී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටලු තුනක් ලියන්න. (ලකුණු 03)

(ඊ) ස්වනිර්මාණ සංග්‍රහයට ඔබ තොරතුරු ලබාගත් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)

(උ) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(02) පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන 150කට නො අඩු රචනය ලියන්න.

(අ) පොදු දේපළ සුරකිමු.

(ආ) කුණු කසළින් තොරව පරිසරය සුරකිමු.

(ඉ) පියකරු උදෑසනක අසිරිය

(ඊ) පොත්පත් කියවීමේ අගය

(උ) වැඩිහිටියන්ට උදවු කරමු. (ලකුණු 14)

(03) ඔබ පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගයට සහභාගී වන ආරාධිතයන් වෙත යැවීමට සුදුසු ආකාරයේ නිර්මාණාත්මක ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ලකුණු 10)

(04) පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථ හා කතුවරු ලියා දක්වන්න.

| | පාඨය | උපුටාගත් ග්‍රන්ථය | කතුවරයා |
|---|---|---|---|
| (අ) | ''නෙලුම් මලේ පෙති සලා<br>පුබුදුවමින් නොම තළා'' | | |
| (ආ) | 'එන්න එන්න - බබා එන්න<br>මෙන්න මෙන්න - මේ බලන්න | | |
| (ඉ) | 'මෙබඳු මහත් ගෙඩි ඇතුළෑ නම්<br>පැන් පොදක් වියෑ යුතු මැ යෑ' | | |
| (ඊ) | ''ඕකට ඔය තරං අඬබෙර ගහන්ට ඕනැයැ'' යි. | | |
| (උ) | ''ස්වාමීනී, උසස් ම ජීවිතයෙන් දෙකෙන් පංගුවක් කල්‍යාණ මිත්‍රයෙකු වීම යයි සිතමි'' | | |

Department of Education - Western Province

(05) සුදනෝ තම සිරිත්

කළවුන් තමන් ලෙසම සලකත්

පහනින් ගත් පහන්

එක ලෙස ම බබළන විලස්නෙන්

(අ) ඉහත සඳහන් කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?

(ආ) එහි කතුවරයා කවුරුන් ද?

(ඉ) කවියට අනුව යහපත් ජනයාගේ ඇති ගුණය කුමක් ද?

(ඊ) ඉහත කවියේ දක්වෙන උපමාව තෝරා ලියන්න.

(උ) පහත දක්වෙන පදවල විරුද්ධාර්ථවත් පද ලියන්න.

සුදනෝ -

සිරිත් - (ලකුණු 2 × 5 = 10)

(06) පහත දක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මදුමල් ගමේ මල්හාමි පොහොසතෙ කී
දුප්පත් දුගී අයගේ හොඳ හිතවතෙ කී
අපායට බියෙන් හැම පාපෙන් වැළ කී
ඔහුට ගිහි ගෙදර කරදර ඇති තැන කී

ගිහි ගෙය ගිනි ගෙයකි පව් රැස්වන ඉඩ ම
පුරන්නට බැරිය මෙහි සිරි ගුණ දහ ම
අත්හැර දමා ගේ දොර සිහිකර මෙහෙ ම
තපසට යන්ට සිතුවා දවසක් හෙතෙ ම

Department of Education – Western Province

(අ) මෙම පද්‍යයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද?

(ආ) මෙහි කියැවෙන අයගේ චරිත ලක්ෂණයක් ලියන්න.

(ඉ) ''ගිහි ගෙය ගිනි ගෙයකි'' යනුවෙන් අදහස් වන්නේ කුමක් නිසා ද?

(ඊ) මෙහි කියැවෙන අය තපසට යන්න සිතන්නේ ඇයි?

(උ) පහත දැක්වෙන පදවල අර්ථ දක්වෙන පදයක් කවි පෙළෙන් තෝරා ලියන්න.

(i) නිරය -

(ii) දිළිදා -

(ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි කරන්න.

(අ) සිලිලාර -

(ආ) අවිසිප් -

(ඉ) මඳ නල -

(ඊ) ශිථිල -

(උ) තුලදර - (ලකුණු 2 × 5 = 10)